# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 2009 අංක 46 දරන අල්හාජ් අබ්දුල් ජවාද් ආලිම් වලියුල්ලාහ් භාරය (සංස්ථාගත කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 2009 සැප්තැම්බර් මස 09 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2009 සැප්තැම්බර් මස 11 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ : රු. 5.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

## 2009 අංක 46 දරන අල්හාජ් අබ්දුල් ජවාද් ආලිම් වලියුල්ලාහ් භාරය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2009 සැප්තැම්බර් මස 09 වන දින]

එල්. ඩී.— ඕ. (අයි.එන්.සී.) 7/2006.

**අල්හාජ් අබ්දුල් ජවාද් ආලිම් වලියුල්ලාහ් භාරය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

පූර්විකාව.

"අල්හාජ් අබ්දුල් ජවාද් ආලිම් වලියුල්ලාහ් භාරය " යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන භාරයක්, එකී භාරයට සම්බන්ධ සියලු පරමාර්ථ හා කරුණු ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද:

එකී භාරයේ භාරකාර මණ්ඩලය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කරුණු සඳහා ද, ඒ පරමාර්ථ හා කරුණු මෙතෙක් කල් එකී භාරය විසින් සාර්ථකව ක්‍රියාත්මක කර හා කරගෙන ගොස් ඇති හෙයින් සහ එම භාරය සංස්ථාගත කරනු ලැබීමට ඉල්ලුම් කර ඇති හෙයින් ද, එකී ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2009 අංක 46 දරන අල්හාජ් අබ්දුල් ජවාද් ආලිම් වලියුල්ලාහ් භාරය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

අල්හාජ් අබ්දුල් ජවාද් ආලිම් වලියුල්ලාහ් භාරය සංස්ථාගත කිරීම.

**2.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට හා ඉන් පසුව (මෙහි මින් මතු " භාරය" යනුවෙන් සඳහන් කරනු ලබන) අල්හාජ් අබ්දුල් ජවාද් ආලිම් වලියුල්ලාහ් භාරකාර මණ්ඩලයේ තත්කාලීන භාරකරුවන් හෝ මෙයින් සංස්ථාගත කරනු ලබන සංස්ථාවේ භාරකරුවන් වශයෙන් මින් මතු ඇතුළත් කරගනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "අල්හාජ් අබ්දුල් ජවාද් ආලිම් වලියුල්ලාහ් භාරය" යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, එකී නමින් සංස්ථාව විසින් ද, සංස්ථාවට විරුද්ධව ද, නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද, එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද, පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය.

2-PL 003877 - 2,750 (2009/05)

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) සංස්ථාවේ දේපළ වන්නා වූ මුස්ලිම් පල්ලි, කුර්ආන්, මද්රසාවන් සහ දර්ගාවන් යනාදිය නඩත්තු කිරීම, ප්‍රතිසංස්කරණය කිරීම සහ අවශ්‍ය විටෙක නව මද්රසාවන් ආරම්භ කිරීම;

(ආ) ජාමිඅතුර්-රබ්බානියියා අරාබි අධ්‍යයන ආයතනය පාලනය කිරීම හා නඩත්තු කිරීම ;

(ඇ) හොඳ ඉස්ලාමීය දහම් දැනුමෙන් පිරිපුන් මවුලවිවරුන් බිහි කිරීම සඳහා ඔවුන් පුහුණු කිරීම ;

(ඈ) මවුලවිවරුන් සඳහා සම්මන්ත්‍රණ, වැඩමුළු හා අධ්‍යාත්මික පුහුණු සැසි සංවිධානය කිරීම සහ පැවැත්වීම;

(ඉ) ඉස්ලාමීය සූෆී දර්ශනය දේශනා කිරීමෙන් අවිහිංසාවාදය කෙරෙහි මග පෙන්වා ඉස්ලාම් භක්තික ජනතාවගේ අධ්‍යාත්මික වර්ධනය නංවාලීම;

(ඊ) ඉස්ලාමයට ඉමහත් සේවයක් කළ ශ්‍රේෂ්ඨයන් සැමරීම සහ එම ශ්‍රේෂ්ඨයන්ගේ දිවි පෙවෙත පිළිබඳ ඉස්ලාම් භක්තික ජනතාවට අධ්‍යයනයක් ලබා ගැනීම සඳහා අවස්ථාව ලබා දීම ;

(උ) අජ්මීර් කාජා මුර්නුද්දීන් තුමාණන් (ජීස්ති) ඇතුළුව අනෙකුත් ඉස්ලාමීය ශ්‍රේෂ්ඨයන්ගේ අනුස්මරණ දිනයන්ට සහභාගී වන්නන්ට දානය පිරිනැමීම ;

(ඌ) මුස්ලිම් ළමුන්, තරුණයන් සහ වැඩිහිටියන්ගේ යහපැවැත්ම උදෙසා පුනරුත්ථාපන කටයුතු සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ;

(එ) මුස්ලිම් තරුණ තරුණියන් සඳහා වෘත්තීය පුහුණු ලබා දීම සඳහා දේශීය හා විදේශීය වෙනත් සංවිධාන සමග ඒකාබද්ධව කටයුතු කිරීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

4. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව සංස්ථාවේ පරමාර්ථ අතුරින් යම් පරමාර්ථයක් හෝ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වා ගෙන යාමේ හා වැසීමේ ද ඇප ඇතිව හෝ නොමැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද ප්‍රදානයන් සහ පරිත්‍යාග භාර

ගැනීමේ සහ එකතු කිරීමේ ද සංස්ථාවේ මුදල් ආයෝජනය කිරීමේ ද සංස්ථාවේ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය නිලධරයන් සේවකයන් සේවයේ නියුක්ත කර ගැනීමේ, සේවයේ යෙදවීමේ සහ සේවයෙන් පහ කිරීමේ ද බලය ඇතුළුව සංස්ථාවේ පරමාර්ථ හෝ ඒ පරමාර්ථ අතුරින් යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම හෝ නංවාලීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය කවර ආකාරයක හෝ සියලු ක්‍රියා, කරුණු හෝ දේ කිරීමේ, ඉටු කිරීමේ සහ ක්‍රියාවේ යෙදීමේ බලය, සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**5.** (1) සංස්ථාවේ කටයුතු, මේ පනතේ විධිවිධානවලට හා 6 වන වගන්තිය යටතේ සාදන ලද රීතිවලට අනුකූලව තෝරා පත්කර ගනු ලැබූ සාමාජිකයන් එකොළොස් දෙනකුගෙන් සමන්විත කළමනාකරණ මණ්ඩලයක් විසින් (මෙහි මින් මතු "කළමනාකරණ මණ්ඩලය" යනුවෙන් හඳුන්වනු ලබන) මේ පනතේ 6 වන වගන්තිය යටතේ සාදන ලද රීතිවලට යටත්ව, පරිපාලනය කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ ප්‍රථම කළමනාකරණ මණ්ඩලය මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී භාරයේ භාරකාර මණ්ඩලයේ සාමාජිකත්වය දැරුවා වූ තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

(3) මහා සභා රැස්වීමක් කැඳවිය නොහැකි අවස්ථාවන්හි දී තීරණ ගැනීම සඳහා වූ සියලු බලතල යාවජීව සභාපතිට තිබිය යුතු අතර, සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් වසියියත්-උපදෙස් ලබා දීමේ බලතල ද ඔහුට තිබිය යුත්තේ ය.

(4) කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයකු මියගියහොත්, ඉල්ලා අස්වුවහොත් හෝ සේවයෙන් පහ කරනු ලැබුවහොත්, එකී පුරප්පාඩුව මේ පනතේ විධිවිධානවලට අනුකූලව සහ 6 වන වගන්තිය යටතේ සාදනු ලැබූ රීතිවලට යටත්ව පුරවනු ලැබිය යුතු ය.

සංස්ථාවේ රීති.

**6.** (1) සාමාජිකයන් බඳවා ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ ඔවුන් නෙරපීම සඳහා ද, කළමනාකරණ මණ්ඩලයේ නිලධරයන් තෝරා පත්කර ගැනීම සඳහා ද, සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු පරිපාලනය කිරීම සහ එහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සම්බන්ධයෙන් ද නීත්‍යානුකූල වන්නේ ය. එසේ සාදන ලද රීති, එවැනිම මහා සභා රැස්වීමක දී එවැනිම ආකාරයෙන් වෙනස් කිරීම, ඒවාට අලුතින් යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ ඒවා ප්‍රත්‍යාදිෂ්ට කිරීම කරනු ලැබිය හැකි ය.

(2) සංස්ථාවේ සාමාජිකයන් මේ වගන්තිය ප්‍රකාරව සාදන ලද රීතිවලට යටත් විය යුතු ය.

භාරය විසින් ගෙවිය යුතු සහ භාරයට අයවිය යුතු ණය.

**7.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවන දිනයට පෙරාතුවම වූ දිනයේ දී භාරයේ පැවති සියලු ම ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරන සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, එදිනට භාරයට අයවිය යුතු සියලු ණය ගෙවිය යුතු දායක මුදල් හෝ සම්මාදම් මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවිය යුතු ය.

සංස්ථාව විසින් නිශ්චල හා චංචල දේපළ දැරිය හැකි බව.

**8.** යම් මිලට ගැනීමකින්, ප්‍රදානයකින්, ත්‍යාගයකින් තෙස්තමේන්තු නීයාදනයකින් හෝ වෙනත් යම් ආකාරයකින් සංස්ථාව වෙත සතු කරනු ලබන යම් චංචල හෝ නිශ්චල යම් දේපළක් අත්කර ගැනීමට සහ දැරීමට සංස්ථාවට නීතියෙන් බලය හා හැකියාව ඇති අතර, එකී සියලු දේපළ සංස්ථාව විසින් මේ පනතේ කාර්ය සඳහා දැරිය යුතු ය. 6 වන වගන්තිය යටතේ සාදන ලද රීතිවලට යටත්ව එකී දේපළ විකිණීමේ උකස් කිරීමේ, බද්දට දීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය ද සංස්ථාව සතු වන්නේ ය.

සංස්ථාව ලාබ නොලබන සංවිධානයක් විය යුතු බව.

**9.** කවර ප්‍රභවයකින් ව්‍යුත්පන්න වුව ද සංස්ථාවේ මුදල් සහ දේපළ හුදෙක්ම මෙහි සඳහන් කර ඇති සංස්ථාවේ පරමාර්ථ නංවාලීම උදෙසා යොදා ගත යුතු අතර, ඉන් කිසිම කොටසක්, සංස්ථාවේ සාමාජිකයන්ට ලාභාංශ, ණය, ප්‍රසාද මුදල් හෝ වෙනත් කවර වුව ද ආකාරයට ලාභ වශයෙන් කෙලින්ම හෝ අන්‍යාකාරයකින් ගෙවීම් හෝ පැවරීම කරනු නොලැබිය යුතු ය.

එසේ වුව ද මේ වගන්තියේ විධිවිධාන මගින්-

(අ) සංස්ථාවේ යම් නිලධරයකු හෝ සේවකයකු විසින් සංස්ථාවට කරන ලද යම් සේවාවක් වෙනුවෙන් සද්භාවයෙන් යම් සාධාරණ සහ නිසි පාරිශ්‍රමිකයක් ඔහුට ගෙවීම ;

(ආ) සංස්ථාවේ යම් සාමාජිකයකු විසින් හෝ සංස්ථාවේ සාමාජිකයකු යම් සමාගමක කොටස්කරුවකු වන අවස්ථාවක ඒ සමාගම විසින්, සංස්ථාවට කුලියට දෙන ලද ස්ථානයක් සඳහා සාධාරණ සහ නිසි කුලියක් ගෙවීම ; සහ

(ඇ) තම කටයුතු හෝ කාර්ය ඉටු කිරීමෙහි ලා හෝ සංස්ථාවේ පරමාර්ථ නංවාලීමෙහි ලා සංස්ථාවේ යම් සාමාජිකයකු නිලධරයකු හෝ සේවකයකු විසින් කළමනාකරණ

මණ්ඩලයෙන් කලින් ලබා ගන්නා ලද අනුමැතිය ඇතිව දරන ලද යුක්තිසහගත හා නිසි වියදම් ආපසු ගෙවීම පියවීම,

වලක්වනු නොලැබිය යුතු ය.

**10.** (1) සංස්ථාවට එහි ම අරමුදලක් තිබිය යුතු අතර, පරිත්‍යාග, ත්‍යාග, තෙස්තමේන්තු නීයාදන, පැවරීම්, සම්මාදම් මුදල්, දායක මුදල් හෝ ගාස්තු වශයෙන් ලැබෙන සියලු මුදල් භාරකාර මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි බැංකු එකක හෝ වැඩි ගණනක සංස්ථාවේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය. සංස්ථාවේ අරමුදල.

(2) සංස්ථාවේ බලතල සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටු කිරීමේ දී සංස්ථාව විසින් දරනු ලබන සියලු වියදම් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

**11.** (1) සංස්ථාව විසින් එහි ආදායම හා වියදම, වත්කම් හා බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය. විගණනය සහ ගිණුම්.

(2) සංස්ථාව යටතේ පවතින මුස්ලිම් පල්ලි, මද්රසාවන්, ආරාබි අධ්‍යාපන පීඨ සහ සේවා ආයතන යනාදී සෑම එකක් සඳහා වෙනම ගිණුම් පවත්වාගෙන යා යුතු ය.

(3) සංස්ථාවේ ගිණුම් සුදුසුකම් ලත් විගණකවරයකු විසින් වාර්ෂිකව විගණනය කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ "සුදුසුකම් ලත් විගණකවරයා" යන්නෙන්—

(i) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක් ; හෝ

(ii) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත්

යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නේ ද එමෙන්ම ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියේ යෙදීම සඳහා එකී ආයතනවලින් යම් ආයතනයකට සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද, එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක්,

අදහස් වේ.

සංස්ථාවේ මුද්‍රාව.

12. සංස්ථාවේ සභාපතිවරයා, ලේකම්වරයා හෝ සංස්ථාවේ රීති මගින් සලසා ඇති ආකාරයට වෙනත් සාමාජිකයකු ඉදිරිපිට දී හැර සංස්ථාවේ මුද්‍රාව කිසිඳු සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, එකී භාර මණ්ඩලයේ සාමාජිකයන් විසින් තමන් පැමිණ සිටි බවට සළකුණක් වශයෙන් ඒ සාධන පත්‍රයෙහි තම නම අත්සන් කරනු ලැබිය යුතු ය. එවැනි අත්සන් කිරීමක් සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලබන අත්සනකට පරිබාහිරව විය යුතු ය.

විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපළ.

13. සංස්ථාව විසුරුවා හැරීමේ දී එහි සියලු ණය සහ බැරකම් පියවීමෙන් පසු දේපළක් ඉතිරි වී තිබුණොත් ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙදීම තහනම් කරනු ලබන්නා වූ ද වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. සංස්ථාව විසුරුවා හරිනු ලබන අවස්ථාවේ දී හෝ ඊට පෙරාතුව ම සංස්ථාවේ සාමාජිකයන් විසින් එම ආයතනය හෝ ආයතන තීරණය කරනු ලැබිය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

14. ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

15. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.